**ශීර්ෂය 210 - ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය, ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත්කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

ශීර්ෂය 210 - ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 31 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 විගණන නිරීක්ෂණය**

**-----------------------**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.12 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී හා ගණන් දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| | **මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | **ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි. | 2.2.1 |
| | | 2. ලේඛන හා පොත් පවත්වා නොතිබීම. | 2.14 |
| | | 3. අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගැනීම. | 2.2.2 (ආ) |
| | | 4. ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම. | 2.2.2 (අ) |
| 128(1)(ඇ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වාගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව. | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු. | 2.8 |

| | | | | |
|---|---|---|---|---|
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශනය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව. | 1. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් කිරීමේ අඩුපාඩු. | 2.3(ඇ) |
| | | 2. | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.3 |
| 128(1)(ක) | ගණන්දීමේ නිලධාරියා වශයෙන් තමා වගකීමට බැඳී සිටින වියදම් ශීර්ෂයක එක් එක් වැඩසටහන වෙනුවෙන් මුදල් වර්ෂය අවසානයේදී විසර්ජන ගිණුමක් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කරනු ලබන බව | | විසර්ජන ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.7 |
| 128(1)(ජ) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බව (වගබලා ගැනීම පිණිස ප්‍රමාණවත් විධිවිධාන යෙදීම විශේෂයෙන් ඔහුගේ යුතුකම් භාරය වන්නේය. ) | | හානි පිළිබඳ වගකීම. | 2.5 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්

(අ) රාජ්‍ය ප්‍රතිපත්ති හා සංවර්ධන ක්‍රියාදාම ඇතුළුව ජාතික වැදගත්කමකින් යුතු කාලීන ක්‍රියාකාරකම් පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම.

(ආ) උසස් මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැගීම.

(ඇ) සංවර්ධන ව්‍යාපෘතීන් හා වෙනත් විශේෂ ව්‍යාපෘතීන් පිළිබඳව කෙටි චිත්‍රපට නිෂ්පාදනය හා වාර්තා වැඩසටහන් නිෂ්පාදනය, ප්‍රදර්ශනය හා සංස්කරණය.

(ඈ) ඉහත අභිමතාර්ථ සපුරා ගැනීම සඳහා මානව හා භෞතික සම්පත් සංවර්ධනය කිරීම.

### 2.2 කාර්යසාධනය

#### 2.2.1 සැලසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර එම සැලසුමට ඇතුළත් කර නොතිබුණි.

#### 2.2.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම.**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතුව තිබූ උපායමාර්ග 08 කට අදාළ ක්‍රියාකාරකම් 57 ක් අතරින් ක්‍රියාකාරකම් 07 ක් ඉටුකර නොතිබුණි. එසේ ඉටු නොකළ ක්‍රියාකාරකම් සඳහා රු.මිලියන 4.8 ක් ප්‍රතිපාදන සලසා තිබුණි. විස්තර පහත දැක්වේ.

| | ක්‍රියාකාරකම | මූල්‍යනය | සලසා තිබුණු ප්‍රතිපාදනය (රු.මිලියන ) |
|---|---|---|---|
| (i) | තොරතුරු තාක්ෂණය දැනුවත් කිරීමේ වැඩසටහන් පාසල් මට්ටමෙන්, ග්‍රාමීය, නාගරික තෝරාගත් පාසල්වල මාධ්‍ය භාවිතය පිළිබඳව දැනුවත් කිරීම. | දේශීය අරමුදල් | 0.5 |

| | | | |
|---|---|---|---|
| (ii) | මැතිවරණ අවස්ථාවන්හිදී මාධ්‍ය සම්බන්ධීකරණය කිරීම. | දේශීය අරමුදල් | 0.8 |
| (iii) | මාධ්‍යවේදීන් සඳහා දෙස් විදෙස් පුහුණුව. | දේශීය අරමුදල් | 1 |
| (iv) | ජාතික මාධ්‍ය පුහුණු ආයතනයක් සඳහා සැලසුම සකස් කිරීම හා ඊට අදාළ දෙස් විදෙස් සාකච්ඡා පැවැත්වීම. | දේශීය අරමුදල් | 1 |
| (v) | මාධ්‍යවේදීන් සඳහා සුභසාධන වැඩපිළිවෙලක් ආරම්භ කිරීම. | දේශීය අරමුදල් | 0.5 |
| (vi) | විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යන්හි ප්‍රචාරණය කරනු ලබන වෙළඳ දැන්වීම්, දේශපාලනික, කාන්තා හා ළමා, පර්යේෂණ වැඩසටහන් යනාදිය පිළිබඳ අවශ්‍යතාවයන් මත වාර්තා පිළියෙල කිරීම. | දේශීය අරමුදල් | 1 |
| (vii) | කාලීන වශයෙන් වැදගත් මාතෘකා සහ මාධ්‍ය ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා සම්බන්ධයෙන් පරීක්ෂණ කිරීම සහ වාර්තා ඉදිරිපත් කිරීම. | | |
| | | | ---------- |
| | | | 4.8 |
| | | | ====== |

**(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු පළමු උපායමාර්ගයේ ක්‍රියාකාරකම් 18 න් ක්‍රියාකාරකම් 06 ක් ඉටු කිරීම සඳහා රු.මිලියන 3.2 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණත්, එයින් අපේක්ෂිත භෞතික නිමවුම් මට්ටම අත්පත් කරගෙන නොතිබුණ අවස්ථා නිරීක්ෂණය විය. තවද, වැඩසටහන් හතරකට අදාළ නිමවුමේ මූල්‍ය වටිනාකම වාර්ෂික කාර්යසාධන වාර්තාව තුළ සඳහන් කර නොතිබීම නිසා නිෂ්ඵල වූ ප්‍රතිපාදනය ගණනය කිරීමට නොහැකි විය. විස්තර පහත දැක්වේ.

| ප්‍රධාන කාර්යභාරය | ක්‍රියාකාරකම | සලසා තිබුණු ප්‍රතිපාදනය (රු.මිලියන) | කාර්යසාධක දර්ශකය අනුව | | |
|---|---|---|---|---|---|
| | | | ඉටු කළ යුතුව තිබුණු ප්‍රමාණය | ඉටු නොකළ ප්‍රමාණය | නිෂ්ඵල වූ ප්‍රතිපාදනය (රු.මිලියන) |
| | | | ඒකක | ඒකක | |
| රාජ්‍ය ප්‍රතිපත්ති හා සංවර්ධන ක්‍රියාදාමය ඇතුළුව ජාතික වැදගත්කමකින් යුතු | (i) 2017 වසරට සියලුම අමාත්‍යාංශ මගින් ඉටු කිරීමටබලාපොරොත්තු වන කාර්යයන් | 0.62 | 52 | 47 | * |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| කාලීන පිළිබඳව දැනුවත් කිරීම. | වැඩසටහන් මහජනතාව | පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ සාකච්ඡා මාලාවක් පැවැත්වීම. | | | | |
| | | (ii) දිස්ත්‍රික් සංවර්ධනය පිළිබඳ මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම. | 0.56 | 8 | 8 | 31 |
| | | (iii) කාලීන විෂයයන් පිළිබඳ මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම. | 0.77 | 16 | 3 | 92 |
| | | (iv) විවිධ අමාත්‍යාංශ මාධ්‍ය ආවරණ කටයුතු කිරීම. | 0.60 | 200 | 144 | * |
| | | (v) පාර්ලිමේන්තු මාධ්‍ය ආවරණ කටයුතු සිදුකිරීම. | 0.18 | 12 | 6 | * |
| | | (vi) පාසල් ළමුන් සඳහා වන මාධ්‍ය වැඩමුළු | 0.50 | 12 | 9 | * |

## 2.3 වත්කම් කළමනාකරණය

----------------------------

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් වාහන, පිරියත හා යන්ත්‍රෝපකරණ, ඉදිකිරීම්, ගොඩනැගිලි, ඉඩම්, කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ පිළිබඳ එම කාර්යාලය වෙත තොරතුරු කැඳවා තිබුණ ද, විගණිත දින වූ 2018 අගෝස්තු 15 දිනය වන විට දෙපාර්තමේන්තුව විසින් වාහන සම්බන්ධයෙන් හැර අදාළ අනෙකුත් තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

--------------------------------------------

2015 මාර්තු 25 දින පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත අනුයුක්ත කරන ලද 2011 වර්ෂයේදී කල්බදු ක්‍රමයට ලබාගත් ඩබල් කැබ් රථයක් 2018 අප්‍රේල් 30 විගණිත දින වන විටත් නැවත දෙපාර්තමේන්තුව වෙත ලබාගෙන නොතිබුණි. එම රථය 2016

දෙසැම්බර් 26 දින අනතුරකට ලක්ව වර්ෂයකට අධික කාලයක් අමාත්‍යාංශ පරිශ්‍රය තුළ ගාල්කර තිබුණි.

(ඇ) **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) නිසි පරිදි ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකර සියයට 2.1 ක පොලී අනුපාතිකයක් මත 1999 දෙසැම්බර් 10 දින ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ප්‍රංශ සැපැයුම්කාර සමාගමක් සමඟ එළඹි ගිවිසුමට අනුව ප්‍රංශ රජයෙන් ලැබුණ ණය ආධාර යටතේ ප්‍රංශ ෆ්‍රෑන්ක් 9,150,000 කට සමාන රු.මිලියන 102.2 කට 2003 වර්ෂයේදී මිලදී ගෙන තිබූ වර්ණ රසායනාගාර උපකරණ 2016 මැයි මාසය වන විටත් අභාවිතව හා නිසි නඩත්තු කිරීමකින් තොරව පැවතුණි. මේ සම්බන්ධයෙන් 2010 වර්ෂයේ පත් කළ ත්‍රිපුද්ගල කමිටුවේ නිර්දේශය වූයේ එම යන්ත්‍ර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ප්‍රසිද්ධ ලංසු කැඳවීමක් මඟින් අලෙවි කිරීම සිදු කළ යුතු බව වුවත් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කළයුතු වුවත්, 2017 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

(ii) මාධ්‍ය විමර්ශන ඒකකයේ කටයුතු සඳහා 2010 වර්ෂයේදී මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් ලබා දී තිබූ ගුවන් විදුලි හා රූපවාහිනී යන්ත්‍ර විමර්ශන පද්ධතිය 2018 අගෝස්තු 31 වන විට මාස 06 ක පමණ කාලයක සිට සම්පූර්ණයෙන් අක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය.

(iii) දෙපාර්තමේන්තුව විසින් 1991 වසරේදී මිලදී ගෙන තිබූ අංක 17-8769 දරන මෝටර් රථය වර්ෂ 02 කට අධික කාලයක සිට අබලන්වද, 2007 වර්ෂයේදී රු.6,490,000 කට මිලදී ගෙන තිබූ මෝටර් රථයක් 2017 දෙසැම්බර් මස සිට විගණිත දිනය දක්වා අභාවිතව ද පවතින බව නිරීක්ෂණය විය.

(ඈ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා චක්‍රලේඛයේ 3.2.6 ඡේදය ප්‍රකාරව 2018 ජූනි 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් එම වාර්තා 2018 අගෝස්තු 31 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සම්පූර්ණ කර නොමැති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ii) 2016 වර්ෂයට අදාළ සමීක්ෂණයෙන් පෙන්වා තිබුණු අතිරික්ත, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

**2.4** **බැඳීම් හා බැරකම්**

--------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විසර්ජන ගිණුමේ දක්වා තිබුණු එකතුව රු.34,591,957 ක බැරකම් විගණිත දිනය වූ 2018 සැප්තැම්බර් 10 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ආ) වැය විෂයයන් 11 කට අදාළ රු.1,309,759.09 ක් වූ බැරකම් විසර්ජන ගිණුමේ දක්වා නොතිබුණි.

**2.5** **හානි පිළිබඳ වගකීම**

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාහන අනතුරු 03 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි 103(1) හි (ඇ), (ඊ) හා (එ) වගන්ති ප්‍රකාරව පරීක්ෂණ පවත්වා වගකිව යුත්තන් නිශ්චය කිරීම, අලාභයට වගකිව යුතු නිලධාරීන් විසින් ඒ සඳහා ගෙවිය යුතු මුදල් ප්‍රමාණය නිශ්චය කොට එම මුදල් පූරණය කරන ලෙස ඔවුන්ට නියම කොට අයකර ගැනීමට ක්‍රියා කිරීම හා උචිත අවස්ථා වලදී බැංකුව, රක්ෂණ සමාගම ඇප සහතිකකරුවන් යනාදියෙන් හිමිකම් පෑම් ඉදිරිපත් කිරීම යනාදී කාර්යයන් සිදුකර නොතිබුණි.

(ආ) හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයෙකුට නිකුත් කරන ලද කාර්යාල උපකරණ 09 ක් වසර 02 කට වැඩි කාලයක් ගතවී තිබුණ ද, දෙපාර්තමේන්තුවට ආපසු භාරදී නොතිබුණ අතර, ඒවා 2014 හා 2015 වර්ෂයන්හි භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල ඌනතාවයන් ලෙස දක්වා තිබුණි. එම නිලධාරියාට විරුද්ධව මුදල් රෙගුලාසි 156 (1) (ආ) ප්‍රකාරව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**2.6** **විසඳා නොතිබුණි විගණන ඡේද**

-----------------------------------

දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කිරීම් කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| (අ) 2014 | 4.2 | 2007 පෙබරවාරි 24 දිනැති අංක සීඑස්ඒ/පී1/40/2007 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛයට පටහැනිව මාධ්‍ය සංවර්ධන සම්මන්ත්‍රණ/ සාකච්ඡා සඳහා අධික මිල ගණන්වලට සුඛෝපභෝගී කාමර පහසුකම් ලබාගැනීම වෙනුවෙන් රු.611,788 ක් වැය කර තිබුණි. ඒ වෙනුවෙන් වූ ලිපිලේඛන කිසිවක් දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන අංශය සතුව නොමැති බව 2015 නොවැම්බර් 24 දින පිළිගෙන තිබුණ ද, රජයට වූ අලාභය අයකර ගැනීමට 2017 දෙසැම්බර් 31 දින වන විටත් පියවර ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ)2014 | 4.13 | 2013 හා 2014 වර්ෂවල මාධ්‍ය සාකච්ඡා සඳහා ආහාර ලබා ගැනීමේදී රු.1,156,288 ක් වැඩිපුර ගෙවා තිබූ බව පිළිගෙන තිබුණ ද, වැඩිපුර ගෙවූ මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ)2014 | 4.17 | පර්යේෂණ විෂය උපාධියේ විෂයයක් ලෙස හැදෑරූ නිලධාරීන් තිදෙනෙකු ඇතුළු නිලධාරීන් 07 දෙනෙකු සේවයේ නියුතු විශේෂ පර්යේෂණ ඒකකයක් දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කර තිබුණි. රටේ සංවර්ධනය පිළිබඳ ක්ෂේත්‍ර සමීක්ෂණයක් කිරීම එම අංශයට නොපවරා අවිධිමත් ලෙස ලංසු කැඳවා බාහිර ආයතනයකට පවරා රු.3,380,000 ක් ගෙවා තිබූ අතර, එම ආයතනය විසින් ලබාදුන් වාර්තාව කිසිදු කටයුත්තක් සඳහා හෝ ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. |
| (ඈ)2015 | 4.7 | ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ නව මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම සම්බන්ධයෙන් උපදේශක ලෙස කටයුතු කළ ඉංජිනේරු සංස්ථාවේ හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ පැවැති සාකච්ඡාවට පිළිතුරු වශයෙන් කළයුතු නිවැරදි කිරීම්වලට අමතරව කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබූ රු.6,623,634 ක මුදල අයකර ගැනීමට ඉංජිනේරු සංස්ථාව නිර්දේශ කර තිබුණ ද එම වැඩිපුර ගෙවීම 2017 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. |
| (ඉ)2016 | 3.11(අ) | ශ්‍රී ලංකා මාධ්‍ය සමාජයේ මත්පැන් විකිණීමේ බලපත්‍රය 2008 වර්ෂයේ සිට විධිමත් ගිවිසුමකින් තොරව බාහිර පුද්ගලයෙකුට පවරා තිබූ අතර, එම පාර්ශවයෙන් අයවිය යුතු රු.4,653515 ක මුදල අයකර ගැනීමට හෝ නීති විරෝධී ලෙස මත්පැන් බලපත්‍රයක් අන්සතු කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විධිමත් ක්‍රියාමාර්ග ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. ශ්‍රී ලංකා සුරාබදු කොමසාරිස්තුමාගේ ලිපිය අනුව 2016 වර්ෂය සඳහා එම ලිපිනයට බලපත්‍රයක් නිකුත් කර නොතිබුණි. |
| (ඊ)2016 | 3.11(ආ) | සංවර්ධනය පිළිබඳ මානව ආකල්ප විමසා බැලීමේ ක්ෂේත්‍ර සමීක්ෂණය සහ මානුෂික මෙහෙයුමට පෙර හා පසු දෙමළ ජනතාවගේ සුභසිද්ධිය සඳහා රජය ගත් ක්‍රියාමාර්ග හා එල්.ටී.ටී.ඊය මේ වන විට ජාත්‍යන්තරයේ ක්‍රියාත්මක වන ආකාරය ජාත්‍යන්තරයට හෙළි කිරීම සඳහා පර්යේෂණ නිබන්ධන සකසා ගැනීම සඳහා වූ ප්‍රසම්පාදනයන්හි දී අවිධිමත් ආකාරයට ක්‍රියා කරමින් රු.4,130,000 ක මුදලක් මානව හා සංවර්ධනය පිළිබඳ කේන්ද්‍රය නමින් ගෙවා තිබුණි. එහෙත් එවැනි ආයතනයක් දක්වා ඇති ලිපිනයෙහි නොමැති බවත් ඉදිරිපත් කර තිබුණු අනෙක් ලංසුකරුවන් දෙදෙනාගේද ලිපිනයන් නොමැති බවත් විගණනයේදී අනාවරණය විය. ඒ අනුව මෙම ප්‍රසම්පාදනයේ නිවැරදිභාවය පිළිබඳ විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය. |

## 2.7 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 181.20 | 179.41 | 1.79 | 0.99 |
| | මූලධන | 9.85 | 9.69 | 0.16 | 1.62 |
| | **එකතුව** | **191.05** | **189.09** | **1.96** | **1.03** |
| 2014 | පුනරාවර්තන | 191.65 | 185.20 | 6.45 | 3.37 |
| | මූලධන | 23.05 | 21.12 | 1.93 | 8.37 |
| | **එකතුව** | **214.70** | **206.32** | **8.38** | **3.90** |
| 2015 | පුනරාවර්තන | 216.36 | 179.64 | 36.72 | 16.97 |
| | මූලධන | 18.54 | 13.82 | 4.72 | 25.46 |
| | **එකතුව** | **234.90** | **193.47** | **41.43** | **17.64** |
| 2016 | පුනරාවර්තන | 212.50 | 190.19 | 22.31 | 10.50 |
| | මූලධන | 26.50 | 22.78 | 3.72 | 14.04 |
| | **එකතුව** | **239.00** | **212.97** | **26.03** | **10.89** |
| 2017 | පුනරාවර්තන | 288.13 | 277.99 | 10.14 | 3.52 |
| | මූලධන | 39.64 | 25.09 | 14.55 | 36.71 |
| | **එකතුව** | **327.77** | **303.08** | **24.69** | **7.53** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 02 හි මූලධන ප්‍රතිපාදනවල ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් සියයට 14 ක සිට සියයට 36 ක් දක්වා වූ පරාසයක පැවති බව නිරීක්ෂණය විය.

(ආ) අධි ප්‍රතිපාදන සලසා තිබීම

වැය විෂයයන් 04 ක් සඳහා එකතුව රු.මිලියන 16.6 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 10.5 ක් පමණක් උපයෝජනය කර තිබූ අතර, ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 21 ක සිට සියයට 77 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**2.8 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 21001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 12.0 | 11.7 | 7.5 | 7.8 | 40.0 | 31.6 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයකර ගත යුතු වසර 17 කට වඩා පැරණි එකතුව රු.195,040 ක ණය ශේෂ හා මියගිය නිලධාරියෙකුගෙන් අයකර ගත යුතු රු.179,855 ක් ණය ශේෂය වශයෙන් එකතුව රු.374,895 ක ණය ශේෂ 2018 ජූලි 10 වන විටද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.9 අග්‍රිම ගිණුම්

දෙපාර්තමේන්තුව විසින් පවත්වා තිබුණු අග්‍රිම ගිණුම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කාර්යය නිමකර දින 10 ක් ඇතුළත ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 68 කට අදාළව ලබා දී තිබුණු එකතුව රු.2,693,561 ක අග්‍රිම කාර්ය නිමවී මාස 01 ක සිට මාස 08 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් පසුව පියවා තිබුණි.

## 2.10 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුමක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 7.99 ක් විය. ඒ තුළ වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.මිලියන 7.8 ක් වූ තැන්පතු 11 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.11 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.

දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 110 හි සඳහන් ආකෘතිය පරිදි හානි හා පාඩු ලේඛනය පවත්වා නොතිබුණි.

## 2.12 අභ්‍යන්තර විගණනය

ගණන් දීමේ නිලධාරීන් විසින් තම දෙපාර්තමේන්තුවල මුදල් රෙගුලාසි 128 හි දක්වා ඇති ස්වකීය රාජකාරි හා වගකීම් ඉටු කිරීම සඳහා තම දෙපාර්තමේන්තුවල අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවා ගත යුතුව බව මුදල් රෙගුලාසි 133 මඟින් අවධාරණය කර ඇතත් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**2.13** **මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

-------------------------------------------------------------------------------------------

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 123.5 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.504,081 ක් වී තිබුණි.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 16 | 7 | 09 |
| (ii) | තෘතියික මට්ටම | 16 | 4 | 12 |
| (iii) | ද්විතියික මට්ටම | 236 | 180 | 56 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 53 | 47 | 6 |
| (v) | අනියම්/ කොන්ත්‍රාත් | 22 | 07 | 15 |
| | | 343 | 245 | 98 |